# 12 වන වැනුම්

සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන කෝට්ටේ යුගයේ දී ලියැවුණු සන්දේශ කාව්‍ය අතරින් ගිරා සන්දේශයට හිමි වනුයේ උසස් තැනකි. බුද්ධ ශාසනයත්, එවක කෝට්ටේ රජ වූ සවැනි සිරි පැරකුම්බාවනුත් රැකදෙන ලෙස නාථ දෙවියන්ට ආයාචනා කරනු මැනැවැයි තොටගමුවේ සිරි රහල් හිමියන්ට ආරාධනා කරනු පිණිස මේ සන්දේශය ලියවී ඇත. සෙසු සන්දේශවලට වඩා සමකාලීන සමාජය ඇසුරින් කරන ලද වර්ණනා ඇතුළත් වීම ගිරා සන්දේශයෙහි එක් විශේෂත්වයකි.

ශ්‍රී ජයවර්ධනපුරයේ සිට තොටගමුවට යන ගමනේ දී ගිරවා වැලිතොට ගසක රාත්‍රිය ගත කරයි. ඒ අසල වූ අම්බලමේ රැස් වූවන් රජු ගැන කරන අපූරු කතා බහට ද සවන් දී සිට පසු දින උදෑසන ම එතැනින් නික්මී යන්නේ රමණීය වන ගැබක් පසු කරමිනි. ඒ වන ගැබේ සෞන්දර්යය කවියා විඳ ගත් ආකාරය මේ පද්‍ය පන්තියෙන් වර්ණිත යි.

1\. දිලිහෙන ගඟු ලැලී ය ඇඳ හැලීය
ගිලිමල් රොන'වුලීය සුදු වැලීය
මද මත් හස කැලීය වන විලීය
දැක යව මන කලිය වන මලීය

2\. අතු අතිනැද ගසා ය තුරු රැසාය
කෙළන පන්දු ලෙසා ය සහ තොසාය
පැන පැන වන හිසා ය මග අසාය
යන වඳුරන් නිසා ය නොව ලසාය

3\. ඉඳුනිල් කොළ'තුරා එපැහැ යු රායා
විලිකුන් අඹ'වුරා තුඩගිනි රායා
එන රස උර උරා ලොබ නොහැ රායා
නරඹ රඳන ගිරා පෙළ ඉඳු රායා

4\. එන රිවි බිඹු දුලා ගිරඟ බ ලායා
ගිරි නිල් මල් තුලා පිල් සස ලායා
දිගු කර නිල් ගෙලා දිගු හඬ ලායා
රඟන මොනර බලා නො සිට ප ලායා

5\. වන සර දැක තම සිත බිය සලසා
ගන ගැබ ලෙළ දෙන විදුලිය විලසා
වන ගැබ ඔබිනොබ පැන යන නො ලසා
තැන තැන මුව රළ දැක යව සතොසා



නොමිලේ බෙදාහැරීම සඳහා ය.



6 වන විල් වැද බොල් සෙවෙලැඟ තව රා
ගන වල් කැල ඇර ගෙන අතිනුදු රා
දිගු උල් සිඟු යොමු කැර කර අඹ රා
පිළි මල් වන මීවුන් දකු නුදු රා

7. විල් තෙර වළ බිඳ හෙව මඩ තවරා
ලොල් කර ඔලු නෙළුඹුල කම් නුදුරා
බොල් කෙළ පෙණ පිඬු දෙකොළින් වගුරා
වල් වැද යන ඌරන් බල ඉඳුරා

8. වැද සෙද උනුනට පසු නො බසිමිනේ
බිඳ බිඳ මී අඹ කැන් ගෙන අතිනේ
ඇද ඇද තුරු වැළ ගළපන ලෙසිනේ
රොද බැඳ එන රිළවුන් බල තොසිනේ

අර්ථ

01. වන පන්තියෙහි ඇද වැටී බබළන්නා වූ ජලධාරා ය, ගිලිහුණා වූ මල් රේණුයෙන් පිරුණු සුදු වැලි තලා ය. මදයෙන් මත් වූ හංසයන් සිටුනා වන විල් ය. (එබඳු) වන සමූහය දැක සතුටින් යව.

විස්තර : වනයෙහි ඇති දියඇලිවල ද මල්රේණුයෙන් පිරී ගිය සුදු වැලිතලාවල ද හංසයන්ගෙන් යුත් විල්වල ද ඇති රමණීයත්වය දක්වූ පරිදි ය.

02. ගස් සමූහය අතු නමැති අතින් ඇද ගසමින් සතුටින් ක්‍රීඩා කරන පන්දු වැනි වූ මාර්ගාසන්නයේ වන සමූහයන්හි පැන පැන යන්නා වූ වඳුරන් නිසා පමා නො වන්න.

විස්තර : එක් ගසක සිට අනික් ගසට පනින වඳුරා එකෙක් අනිකකුට ගසන පන්දුවක් වැනි ය. එබඳු විසිතුරක් වුව ද එය බැලීම සඳහා කල් නො යවන්නැයි කියැවිණ.

03. ඉන්ද්‍ර නීල වර්ණ වූ කොළ අතුරෙහි ඒ පත්‍රවල බැබළීම සම්පූර්ණ කොට හිඳ ඉදුණු අඹ ගෙඩි වසා සිටිමින්, තුඩු අගින් පළා වැහෙන්නා වූ රස උරමින් (එහි) ලෝබය අත් නොහැර සිටින ගිරා සමූහය නොවරදවා ම බලව.

විස්තර : අඹ කොළ තද නිල් පැහැ ඇත්තේ ය. ඒ කොළ අතරෙහි ඉදුණු අඹ ගෙඩි වෙයි. ගිරවා එහි උන් කල උගේ පියාපත් පැහැය හා එකතු වී අඹ කොළ පැහැය සම්පූර්ණ වෙයි. මෙසේ අඹ පලය වසාගෙන සිටිමින් ගිරවා තුඩින් ඉරා යුෂය උරයි. කොපමණ ඉරුව ද ආසාව නො සන්සිඳේ. අඹ එතරම් ම මිහිරි ය. කවි සමයේ දී නීල වර්ණය හා හරිත වර්ණය එකක් සේ ම සැලකේ. ඉඳුනිල් යනු ඉතා නිල් මැණික් විශේෂයකි.

04. උදාවෙමින් බබළන සූර්ය බිම්බය බලා පර්වත මුදුන්වල ගිරි නිල් මල් වැනි පිල් සොලවා පිල්වල ඇති ඇස් විදහා නිල් පාට බෙල්ල දිගු කොට දික් හඬ නඟා නටන මොනරුන් බලා නො සිට පලා යව.

**විස්තර :** සූර්යෝදයේ දී මොනරු පිල් විදහා ගෙල දිගු කොට හඬ නඟා නටති.

05. වැද්දන් දැක තම සිතෙහි බිය උපදවා ගෙන ගන වූ වැහි වලාකුළෙහි ඔබින් ඔබ ලෙළදෙන විදුලිය මෙන් වනය තුළ වහා පැන පැන යන මුව සමූහය තැන්හි තැන්හි දැක සතුටින් යව.

**විස්තර :** වැද්දන් දැක බිය වූ  මුවෝ වනයේ ඒ ඒ තැන පැන පැන දුවති. නිල් වනය ඇතුළෙහි මුවන් පැනීම නිල් වලාකුළෙහි විදුලිය කෙටීම වැනි ය.

06. කැලෑවේ විල්වලට වැදී ගන සෙවෙල් ශරීරයේ තවරා ගෙන ගන වල් (පැළෑටි) සමූහය අතින් (ඉදිරි පයින්) උදුරා අරගෙන දික් වූ උල් වූ අං ඉදිරියට හරවා බෙල්ල කරකවා ඔවුනොවුන්ට විරුද්ධ ව සිටින මී හරකුන් නුදුරෙහි බලන්න.

**විස්තර :** මී හරක් ඇඟෙහි සෙවෙල් තවරාගෙන ඉදිරි පයින් වල් පැළ උදුරමින් උනුන් පොර ඇන ගැනීමට යන ආකාරය බලන්න යැයි කී පරිදි ය.

07. විල් අද්දර වළවල් හාරා එහි ලැග මඩ තවරාගෙන ඕලු නෙළුම් අල මහත් ආසාවෙන් යුක්ත ව උදුරා කමින් ගන වූ කෙළ ද පෙණ කැටි ද මුව දෙපසින් වගුරුවමින් වනයට වැදී යන්නා වූ ඌරන් නොවරදවා ම බලන්න.

**විස්තර :** ඌරෝ විල් අද්දර වළවල් හාරා එහි ලැග ඇඟෙහි මඩ තවරා ගනිති. විලෙහි ඇති ඕලු නෙළුම් අල උදුරා ගෙන කති. එසේ කන විට කට දෙකෙළවරින් පෙණ කැටි වැගිරෙයි.

08. වහා ඉදිරියට පැන ඔවුනොවුන් හට පසු නොවී මී අඹ වලු කඩා අතින් ගෙන ගස් පෙළ (එකට) ඇද ඇද ගළපන්නා සේ පෙළ ගැසී එන රිළවුන් සතුටින් බලන්න.

**විස්තර :** රිළවුන් පෙළගැසී ගසින් ගසට යන කල ලණු ඇද ගස් එක් කොට ගළපන්නා සේ පෙනේ. උන් යන්නේ එකකු අනිකකුට ළංව ය. එකෙකුදු පසු නො බසියි. එහෙයින් රිළවුන් පෙළ ලණුවක් සේ පෙනෙයි.

## ක්‍රියාකාරකම - 01

කණ්ඩායම් වශයෙන් බෙදී මේ පද්‍ය පන්තිය තාලයට ගායනා කරන්න.



නොම්ලේ බෙදහැරීම සඳහා ය.

## ක්‍රියාකාරකම - 02

(i) වන වැනුමේ දී කවියා ගිරවාට බලන්න යැයි නියමකොට ඇති ස්ථාන හා සිදුවීම් මොනවා ද?

(ii) මීවුන් හැසිරුණු ආකාරය විස්තර කරන්න.

(iii) වඳුරන් හා රිළවුන්ගේ හැසිරීම කවි ඇසට පෙනී ඇති ආකාරය විස්තර කරන්න.

(iv) **'වන සතුන්ගේ හැසිරීම්වලට යෝග්‍ය කාව්‍ය ආකෘතියක් කවියා මෙහි දී යොදා ගෙන ඇත.'** මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

## ක්‍රියාකාරකම - 03

(i) ''වන සිරියාව'' ගැන කවි කීපයක් නිර්මාණය කරන්න.

(ii) පන්තිය කණ්ඩායම් වශයෙන් සංවිධානය වී පද්‍ය පන්තියේ වර්ණිත වනයේ ස්වරූපය අනුපිළිවෙළින් ඉදිරිපත් කරන්න.

## ක්‍රියාකාරකම - 04

### උපසර්ග

**'පිළිමල් වන මීවුන් දකු නුදුරා'** මේ පද්‍ය පාඨයේ එන **'පිළිමල්'** යන පදය සෑදී ඇත්තේ 'පිළි', 'මල්' යන කොටස් දෙකේ එකතුවෙනි. මෙසේ නාම පදයක හෝ ක්‍රියා පදයක මුලට යෙදී **'විවිධාර්ථ'** ප්‍රකාශ කරනුයේ උපසර්ගයි.

**උදාහරණ**

නාම පද   අබිදම්, දුගඳ
ක්‍රියා පද   පිළිගනු, උගෙනියි, පිරිහිණ

උපසර්ග ඒ හා බැඳෙන පදය සමග එක් කොට ම ලියනු ලැබේ. භාෂා කාර්යයන්හි දී බොහෝ උපසර්ග භාවිතයට ගැනේ. උපසර්ග යෙදීමෙන් පදවලට විවිධ අර්ථ ගැන්වීමට හැකි වේ.

පහත දැක්වෙන නිදසුන් විමසන්න.

- **අර්ථ බාධා කිරීම සඳහා**

ප්‍රති + පක්ෂ = ප්‍රතිපක්ෂ
වි + මල = විමල
දු + බල = දුබල
අව + ගුණ = අවගුණ

- **අර්ථ උසස් කිරීම සඳහා**

  ප + බල = පබල

  සු + මිහිරි = සුමිහිරි

  උ + දුල = උදුල

  අති + රස = අතිරස

උපසර්ගවලට යටින් ඉරි ඇඳි මේ වාක්‍ය ද කියවා උපසර්ග යෙදීම පිළිබඳ ඔබේ අවබෝධය තහවුරු කරගන්න.

1. අයවැය යෝජනාවට පක්ෂ ව ඡන්ද 60ක් ද ප්‍රතිපක්ෂ ව ඡන්ද 50ක් ද ලැබිණ.
2. ඇතැම් බොජුන්හලවල සුමිහිරි බොජුන් ඇතැ'යි ඇතමෙක් පවසති.
3. වාද කිරීම සඳහා පැමිණි සාමාජිකයනට උපදේශකවරයා අවවාද කළේ ය.

i) පහත සඳහන් පදවලට යෝග්‍ය උපසර්ග යොදමින් වාක්‍ය නිර්මාණය කරන්න.
i. ගුණ, ii. ලකුණු, iii. ලස, iv. පුත්, v. දුක්, vi. වර, vii. මානය, viii. නම්බුව, ix. බල, x. වාස

ii) වරහන තුළ දැක්වෙන පදවලට සුදුසු උපසර්ග යොදමින් වාක්‍යවල හිස්තැන් පුරවන්න.
**උදා :** ඔහුගේ ජයග්‍රහණය ගැන ඇසූ අපි ඉමහත් සතුටට පත්වීමු.

(i) සුදාරක ................................................ අනුගමනය කරයි.

(ii) වීරෝදාර රණවිරුවාගේ ................................... සිදු වූයේ ත්‍රිවිධ හමුද ආචාරය මධ්‍යයේ ය.

(iii) වැඩිහිටියන්ගේ ............................... තොර ව කටයුතු කිරීමෙන් වළකින්න.

(iv) වෛද්‍යාචාර්යතුමා ............................... කළේ කෘත්‍රිම ආහාර ගැනීමෙන් වළකින ලෙස ය.

(v) ........................................ සටන මෙහෙයවීම සඳහා සටන් පෙරමුණට ගියේ ය.

(vi) ........................................ ඇසීමට වාසනාව ලැබෙන්නේ බුද්ධෝත්පාද කාලයට ය.

(vii) ........................................ සෙනෙහසින් මව දරුවා රැක බලා ගනියි.

(viii) හෙළ විරු දම්පල් දෙස් ................................... පතළ කිතු ගොස ඇති උතුමෙකි.

(ix) විශ්වය පිළිබඳ දැනුම් සම්භාරය ............................ සාගරය වැනි ය.

(x) දුදනෝ ........................... පත්වෙති.

(දැනුමෙන්, සෙනෙවියා, සිරිත්, මඟුල, වාද, ගැඹුරු, දෙස්, මහත්, දම්, කීර්තියට)